# දකුණු පළාතේ දමිළ භාෂා භාවිතයේ සුවිශේෂීතාවය පිළිබඳව සංසන්දනාත්මක අධ්‍යයනයක්

ආර්.එම්.ඩබ්. .ජී. ප්‍රදීපා රාජනායක
ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය
Pradeeparajanayaka90@gmail.com

ශ්‍රී ලංකාවේ දකුණු පළාත යනු භාෂාමය වශයෙන් ඉතා වැදගත් ඔවුන්ටම ආවේණික භාෂා ලක්ෂණ රාශියකින් සමන්විත මිනිසුන් පිරිසක් වාසය කරන පළාතකි. කෘෂි කර්මාන්තය හා ධීවර කර්මාන්තය ප්‍රධාන ජීවනෝපායන් කර ගත් දකුණු පළාත තුළ සිංහල ජාතිකයින් මෙන්ම දෙමළ හා  මුස්ලිම් ජාතිකයෝ ද ජීවත් වෙති. මෙම පර්යේෂණයේ මූලික අරමුණ වන්නේ දකුණු පළාත කේන්ද්‍ර කොටගෙන එනම් ගාල්ල, මාතර හා හම්බන්තොට යන දිස්ත්‍රික්කයන්වල ජීවත් වන දෙමළ හා මුස්ලිම් ජාතිකයන්ගේ දමිළ භාෂා භාවිතයෙහි පවතින සුවිශේෂත්වය ප්‍රධාන කොට ගෙන එනම් ශ්‍රී ලංකාවේ අනෙකුත් දමිළ භාෂිත ප්‍රදේශයන් හා සසඳන විට දක්නට ලැබෙන වෙනස්කම් පිළිබඳව සොයා බැලීමයි. මෙම සමාජ ස්ථරයෙහි පවතින වාක් මාලාව තුළ අනෙකුත් දමිළ භාෂිත ප්‍රදේශයන් වලට වඩා බොහෝ දුරට වෙනස්කම් පවතී. එකී වෙනස්කම් එම ප්‍රදේශයේ ජනතාවගේ උච්චාරණ විධි, උගත් නූගත්කම්, පරිසර වෙනස්වීම්, ජීවන රටාව ආදි කරුණු මත පදනම් ව පවතින බවක් දක්නට ලැබේ. මෙම පර්යේෂණය සඳහා සම්මුඛ සාකච්ඡා ප්‍රධාන පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් භාවිත කළ අතර එහි දී දකුණු පළාතේ ජීවත් වන විවිධ වයස් මට්ටමේ පුද්ගලයන්ගෙන් දත්ත රැස් කර ගන්නා ලදි. සංසන්දනාත්මකව ගත් විට ශ්‍රී ලංකාවේ අනෙකුත් පළාත් වල ජීවත් වන දමිළ භෂකයින්ගේ දමිළ වහරට වඩා වෙනස්ව යමින් දකුණු පලාත් වාසී දමිළ භාෂකයින්ගේ දමිළ භාෂා භාවිතය අතර විශේෂයෙන් පෙන්නුම් කරනු ලබන වෙනස්කම් රාශියක් දක්නට ලැබුණු බව එනම් අනෙකුත් ප්‍රදේශයන් වල ජීවත් වන දමිළ හා මුස්ලිම් ජනතාවගේ භාෂිත දමිළ භාෂාව අතර වෙනස් වන උපභාෂාමය ලක්ෂණ රැගත් සමාජයක් ලෙස දකුණු පළාත් දමිළ වහර හඳුන්වා දිය හැකි ය.

**ප්‍රමුඛ පදඃ** දකුණු පළාත; වාක් මාලාව; උච්චාරණ විධි; දමිළ භාෂා භාවිතය; උපභාෂා